www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද යුද හමුදාවේ ම්ලේච්ඡ ක්‍රියා හා ඇමරිකානු ජනතාව හමුවේ ඇති සදාචාරාත්මක තේරීම

## US military atrocities and the moral choice facing the American people

**ඩේවිඩ් නෝර්ත් හා ඩේවිඩ් වොල්ෂ් විසිනි**
**2005 මැයි 24**

ඉරාකයෙහි, ඇෆ්ඝනිස්තානයෙහි හා කියුබාවේ ගුවන්තනාමෝ බේහි සිදු කරන ලද බරපතල අපරාධ පිලිබඳව එක්සත් ජනපද ජනාධිපතිට හා ඔහුගේ පරිපාලනයෙහි අනෙකුත් සාමාජිකයන්ට *නිව් යෝක් ටයිම්ස්* පුවත් පත මැයි 23 දින පලකරන ලද කතුවැකියකින් චෝදනා එල්ල කෙලේ ය.

ඉරාකයෙහි අබු ග්‍රයිබ් සිර කඳවුර තුල සිදු කරන ලද අපරාධවලට ඇමරිකානු ආන්ඩුව මුහුන දුන් අකාරය වගකීමේ හා විනිවිදභාවයේ ආදර්ශයක් වනු ඇති බවටත් වගකිවයුත්තන්ට දඬුවම් පමුනුවනු ඇති බවටත් ජෝර්ජ් ඩබලිව්. බුෂ් විසින් කරන ලද ප්‍රකාශයක් ''අපචාරි රටාවන්'' යන මැයෙන් යුතු කතුවැකියක ප්‍රථමයෙන් සටහන් කරයි. ඡායාරූපවලට පෙනීසිටීමට මෙය කදිම අවස්ථාවක් වුවද ''අවාසනාවකට මෙන් මේ කිසිවක් සත්‍ය නො වේ'' යයි *ටයිම්ස්* කතුවරු ප්‍රකාශ කරති. වෙනත් වචනවලින් කිව හොත් ජනාධිපති බොරුකාරයෙකි.

එක්සත් ජනපද හමුදා නිලධාරීන් බග්‍රාම් සිරගෙය තුල ඇෆ්ගන් ජාතිකයන් දෙදෙනකු බියකරු ලෙස මරා දැමීම පිලිබඳ කොටස් දෙකකින් යුතු සවිස්තරාත්මක ලිපි පෙලක් සමග පලකරන ලද මෙම කතුවැකිය, වර්තා සැඟවීම හා පරීක්ෂන අවහිර කිරීම සම්බන්ධයෙන් පාලන තන්ත්‍රයට චෝදනා නගයි. තවද, ''නිල පරීක්ෂන තුලින් ධවල මන්දිරයෙහි, අධිකරන දෙපාර්තමේන්තුවෙහි හා පෙන්ටගනයෙහි ප්‍රතිපත්ති සම්පාදකයන් පිලිබඳ කිසිදු බැරෑරුම් විමර්ශනයක යෙදීම පාලන තන්ත්‍රය විසින් වලකාලීම මඟින් සිර කඳවුරෙහි ප්‍රතිපත්ති සකසන ලද්දේ කෙසේද හා එම ප්‍රතිපත්ති තුලින් අපචාරවලට මගපෑදුනේ කෙසේද යන කේන්ද්‍රීය ප්‍රශ්නය අහලකටවත් ඒමට හෝ හැකියාවක් නො තිබුනි''.

''අබු ග්‍රයිබ් සිර කඳවුර තුල සිදු වූ ද සම්මතයෙන් බැහැර වූවක් නොව, පුලුල්ව පැතුරුනු රටාවක කොටසක්''යැයි *ටයිම්ස්* පුවත්පත ප්‍රකාශ කරයි. ත්‍රස්ත විරෝධී මෙහෙයුම්වලදී අත්අඩංගුවට ගන්නා ලද සිරකරුවන් සම්බන්ධයෙන් ජිනීවා සම්මුතීන් හෝ සැබැවින් ම ඇමරිකානු නීතිය පවා, අනුගමනය නො කරන බවට බුෂ් මහතා හා ඔහුගේ උපදේශකයන් මුලින් ගන්නා ලද තීරනයෙහි බේදනීය බලපෑම එමගින් විදහා දැක්වුනි.

එසේනම්, ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කෙරෙන යුද අපරාධවලට පාලන තන්ත්‍රය වැරදිකරු වේ.

පවරන ලද නිල ප්‍රතිපත්තිය වූයේ සිරකරුවන්ට මානුෂීය සැලකිල්ලක් දැක්විය යුතු ය යන්න වුවද එසේ කල යුත්තේ ''හමුදාමය අවශ්‍යතාවන්ට'' ගැලපෙන අවස්ථාවන්හි දී පමනක් ය යන්න මගින් විමර්ශකයන්ට ඒත්තු ගැන්වුනේ තමන්ට ''නියාමවලින් යන්තමින් පිට පැනිය හැකි'' බව ය. එක්සත් ජනපද මිලිටරියේ යන්තමින් පිට පැනීම්වලට සිරකරුවන් මරා දැමීමත් ඉන් පසුව ඔවුන් මරනයට පත්වීමේ හේතුව සඟවාලීමත් ඇතුලු තත්වයක් නිර්මානය කිරීමට එමගින් අවස්ථාව සැලසුනි.

මෙය පැහැදිලිව සඳහන් කිරීම අතපසු කල ද *ටයිම්ස්* පත්‍රය ජනාධිපති, උප ජනාධිපති හා ආරක්ෂක ලේකම්, වධහිංසා පැමිනවීම හා මිනීමැරීම් අනුමත කල බවට චෝදනා කරයි. අදාල කරුනු ඉතා පැහැදිලි ය. යථාර්ථයේදී, ඉරාක ආක්‍රමනය අනුමත කරමින් එයට සහාය දක් වූ *ටයිම්ස්* පුවත් පත ද ඇතුලුව සමස්ත දේශපාලන හා මාධ්‍ය සංස්ථාපිතය ම මෙයට පටලැවී ඇත.

බග්‍රාම් හි මිනීමැරුම් ද අබු ග්‍රයිබ්හි අපචාර ද අයිස් කූට්ටියේ තුඩ පමනි. ඉරාකය ඇෆ්ඝනිස්තානය, හා කියුබානු රැඳවුම් කඳවුර තුල දෛනික පදනමක් මත, අපරාධ සිදු කෙරීගෙන යන බව යමෙකුට පරස්පරයක පැටලීමේ බියෙන් තොරව ප්‍රකාශ කල හැකි ය. ම්ලේච්ඡ ක්‍රියා මෙයට වඩා එලිදරව් නොවන්නේ නම් ද ඒවායෙහි යෙදීම සම්බන්ධයෙන් දැඩි කෝපයක් ඇති නොවන්නේ නම් ද එයට හේතුවන තත්වය පැහැදිලි කල යුත්තේ ඇමරිකානු පාලක ප්‍රභූව තුල එවැනි විධික්‍රමවලට ලැබෙන පොදු සහාය තුලිනි.

*ටයිම්ස්* කතුවරුන් තවදුරටත් පවත්වා ගෙන යන ලොකු ම ප්‍රබන්ධය නම්, ඇෆ්ඝන්වරුන්ට හා ඉරාක ජාතිකයින්ට එරෙහිව එල්ල කෙරෙන සැබැවින් ම කෲර ප්‍රහාර සමස්තයක් වශයෙන් යුද්ධයෙහි ස්වභාවයෙන් වෙන්කර සැලකිය හැකිය යන්න ය. එම පුවත්පතෙහි වදනින් ම දක්වතොත් ''පුලුල්ව පැතිරුනු රටාවක''

කොටසක් වූ ක්‍රමානුකූල හා සාපරාධී කෲරත්වය, අන් සියලු අයුරින් ශ්‍රේෂය, ප්‍රජාතන්ත්‍රීය මුහුනතක සුලු කැලලක් වන්නා සේ ය.

එයට ප්‍රතිවිරුද්ධව, එක්සත් ජනපද ප්‍රතිපත්තියෙහි ස්වභාවය අගැයීම සඳහා වඩාත්ම යෝග්‍ය පදනම සැපයෙන්නේ බග්‍රම්හි සිද්ධීන් තුලිනි. ඇෆ්ඝනිස්තානයෙහි හා ඉරාකයෙහි ඇමරිකානු ව්‍යාපෘතියෙහි කේන්ද්‍රීය අරමුනු අතරින් එකක් එම සිද්ධීන් මගින් කැටි කොට දක්වයිඃ එනම්, තමන් යටතේ සිටින යටත් විජිත ජනතාවන් ත්‍රස්තකිරීම ය.

මධ්‍යම ආසියාව හා මැද පෙරදිග එක්සත් ජනපද ආක්‍රමනයෙහි හා මිලිටරි ග්‍රහනයෙහි සියලු අංග අතින් ආරම්භයේ සිට ම සාපරාධී ව්‍යවසායන් විය. පවතින ගැටුම් සාධාරනීකරනය කරන බොරු ද, ඔවුන්ගේ අපරාධ වසං කරන බොරු ද ගලා එන්නේ එකම මූලාශ්‍රයෙනිඃ එනම්, මුලු ලොව ම සිය ප්‍රතිගාමී පාලනය යටතට ගෙන ඒමේ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ප්‍රයත්නයෙනි. ප්‍රතිරෝධයට හෝ ඇතැම් අවස්ථාවන්හි දී යටත් කර ගත් ජනතාවක් පැවතීමට පවා දක්වෙන ප්‍රතිචාරය වන්නේ කෲර ලෙස බලය යෙදවීම යි.

ඉරාක යුද්ධයට පෙරාතුව, බැරෑරුම් විමර්ශනයක් කෙරුනි නම්, ඉන් ඔප්පුවනු ඇත්තේ සදාම් හුසේන්ගේ තන්ත්‍රය පිලිබඳ බුෂ් පරිපාලනයෙහි කියාපෑම් බොරු බව ය. ඇමෙරිකානු ජනමාධ්‍ය තුල මෙය නො දන්නා කෙනෙකු සිටියේ නම්, ඒ ඔහු හෝ ඇයඃ දූන නොගැනීම සිය තෝරාගැනීම කරගත් නිසා ය. රිපබ්ලිකන් පක්ෂයෙහි නව ෆැසිස්ට්වාදී ''පදනමේ'' පටන් මර්ඩොක්ට අයත් අන්ත දක්ෂිනාංශික මාධ්‍යයන් ගේ හා ජෝන් කෙරී, ඩිමොක්‍රැටික් පක්ෂය, ''ලිබරල්වාදී'' ටයිම්ස් හා වොෂිංටන් පෝස්ට් පුවත්පත් දක්වා වූ මේ සියලු දෙනා අපරාධයට සම්බන්ධ වූවන් ය.

විශේෂයෙන් ම ඇමරිකාවේ, හැමවිට ම සද්දන්ත බොරුවලට සිදු වන පරිදි, මෙම බේගල් ද අනාවරනය වෙමින් පවතී. බග්‍රාම්හි ගාල් කිරීමේ කඳවුරෙහි ද අබු ග්‍රයිබ්හි ද භීෂනයේ සිද්ධීන් ඇමෙරිකානු ජනතාව ඉදිරියට පමුනුවන්නේ පැහැදිලිව පෙනෙන සදාචාරාත්මක තෝරාගැනීමකි.

මේ ගැටලු කෙරේ යොමුවීමෙහි දී පලමු පියවර ද වගකීම ද වන්නේ වර්තමාන තත්වය පිලිබඳ සත්‍ය පැවසීම යි.

''ගෞරවනීය'' එක්සත් ජනපද මිලිටරිය මැද පෙරදිග ද ආසියාවේ ද අනාරක්ෂිත ජනතාවන් මත මුදා හැර තිබීමේ ප්‍රතිඵල බිය ජනක ය. ඇමරිකානු සමාජයෙහි පිලිකුලට හා හෙලාදැකීමට ලක් වන බොහෝ දූ යුද හමුදාවන් තුල දිරිගන්වා ද පෝෂනය කර ද ඇති අතර පරපීඩකයන් මානසික රෝගීන් ද නොවලහා කියතොත්, දුරාචාරයෙහි යෙදෙන්නන් ද සැලකිය යුතු පිරිසක් ආකර්ශනය කරගෙන හෝ බිහිකොට ඇත. සංස්කෘතිකමය හෝ සදාචාරත්මක පුස්සන් බවට ද ජනගහනයේ පාදඩයන් බවට ද පත් කරනු ලැබූ මෙම කොටස ආගමික මූලධර්මවාදයේ, ජාතිකවාදයේ, ලේ හා තුවක්කු ලබ්ධියේ ප්‍රතිගාමීත්වයෙහි දැඩි බලපෑමට හසුව සිටිති.

බග්‍රම් හි සිරකරුවන්ට පමුනුවන ලද කායික හා මානසික වධහිංසාවල විස්තරය කෙනෙකු ශාරීරිකව රෝගී තත්වයට පත් කරයි. ලොව වටා ම මෙම හමුදාවේ කටයුතු තුල එකම වර්ගයේ අසභ්‍ය පරපීඩාකාමුකත්වය නැවත නැවතත් අපට දැකගත හැකිය!

පරිපාලනයේ නිලධාරින් සිය අපරාධවලට කිසිවිටක තමන් වගකිව යුත්තන් නො කෙරෙන්නේ ය යන විශ්වාසයේ පිහිටා සිටිති. මේ විශ්වාසය රඳා පවතින්නේ පාලක ප්‍රභුව තුල එවැනි හැසිරීමකට සහාය දක්වීම පිලිබඳව පුලුල් එකඟත්වයක් පවතින බවට ඇති සාධක මත ය. 2001 සැත්තැම්බර් 11 වැනිදා සිද්ධීන්ට අනතුරුව, ආන්ඩුවේ ප්‍රකාශකයන් හා ඇලන් ඩර්ෂොවිට්ස්, ටෙඩ් කොපෙල් හා මයිකල් ඉග්නාටියෙෆ් වැනි ලිබරල්වාදී පන්ඩිතයින් නිශ්චිතව හෝ හැඟීයන පරිදි වධහිංසා පමුනුවීමට පක්ෂව කථාකර ඇත. ඇමරිකානු සමාජයෙහි ඉහල ස්ථරයන් තුල අව්‍යාජ ප්‍රජාතන්ත්‍රීය සවිඥානකත්වය මුලුමනින් ම පාහේ කැඩී බිඳී ගොස් ය. අද දින ඕනෑම දෙයක් ඔට්ටු ය.

සෑම ඒකාධිපති තන්ත්‍රයකම කාලයාගේ ඇවෑමෙන් සම්මානනීය වූ ප්‍රකාශය වන්නේ ''ත්‍රස්තවාදයට එරෙහිව සටන් වැදීමටත්'' ජීවිත බේරාගැනීමට ''ඉවහල්විය හැකි තොරතරු ලබාගැනීමටත් ම්ලේච්ඡ විධික්‍රම අවශ්‍යය යන තර්කය'' ව්‍යාජ මෙන්ම නීති විරෝධීද වන්නේ විශේෂයෙන් ම 2001 වසරේ ත්‍රස්තවාදි පැහැරගෙන යෑම් පිලිබඳව එක්සත් ජනපද ආන්ඩුව සතුව ඊට පෙරාතුව සෑහෙන දැනුමක් තිබුන ද ඒ මත ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කිරීමේ තත්වය තුල ය. තවද, මේ තර්කය දේශපාලන යථාර්ථය සැලකිල්ලට නො ගනීඃ එනම්, වධදීම කිසිවිටෙකවත් යම් නිශ්චිත තොරතුරු කිහිපයක් ලබාගැනීම සඳහා නොව සමස්ත ප්‍රතිපත්තියක එක අංගයක් පමනක් වීම යි. එහි අරමුන වන්නේ ප්‍රතිරෝධය දක්වන ව්‍යාපාරයක හෝ ජන සමූහයක අධිෂ්ඨානය බිඳ හෙලීම ය. එදා නාසි බලධාරීන් කල එම කටයුත්ත අද දින ඇමරිකානු මිලිටරිය විසින් ක්‍රියාත්මක කරයි.

ඇෆ්ඝනිස්තානය හා ඉරාකය තුල සිදුකරන අපරාධ පිලිබඳව පිලිකුල ප්‍රකාශ කෙරෙන පුලුල් හඬ නැගීමක් නොමැතිවීම නිර්ලජ්ජිත ය. එය ප්‍රකට කෙරෙන්නේ ඇමෙරිකානු මහජන මතයෙහි පරිහානිගත තත්වය යි.

මේ පිලිබඳව වරද පැටවිය යුතු තැන්හි අඩුවක් නැත. දේශපාලන ව්‍යුහයන් මුලුමනින් ම හසුරුවනු ලබන හා සැබැවින් ම ගෙල සිර කරනු ලබන ව්‍යාපාරික බලවේග විසින් වාතය අපවිත්‍ර කොට ඇත. මෙම කුනුවූ වතාවරනය, 1990 ගනන්වල හා 2000

ගනන්වල ඇමරිකානු ධනවාදයේ ක්‍රියාකාරිත්වයෙහි සදාචාරාත්මක හා දේශපාලනමය පිලිබිඹුව වන අතර එය පරපුටුවාදයෙන්, දූෂනයෙන් හා සාපරාධීත්වයෙන් පිරී ඉතිරී ගොස් ය.

දේශපාලනඥයින්ගේ වර්තමාන රැල්ල මේ ක්‍රියාවලියන්ගේ අනිවාර්ය නිමැවුමකි: 2008 වසරේ රිපබ්ලිකන් පාක්ෂික ජනාධිපති නාම යෝජනා සඳහා තරග වදින්නෙකු ලෙස සැලකෙන, පෙනිසිල්වියාවේ අන්ත දක්ශිනාංශික කතෝලික සෙනට් සභික රික් සැන්ටෝරම් වැනි පුද්ගලයින් එවැනි නිමැවුමකි. *නිව් යොර්ක් ටයිම්ස්* පුවත්පතේ ඉරිදා සඟරාවේ මෑත ලිපියකින් මෙම කාරනය ගෙනහැර දක්විනි. පලමු නොමේරූ දරුවා උපතෙහිදී ම මරනයට පත් වූ විට සැන්ටෝරම් සහ ඔහුගේ බිරිඳ ''අලුත උපන් දරුවාගේ මල මිනිය මෘත ශරීරාගාරයට භාර කිරීම ප්‍රතික්ෂේප කරමින්'' එදින රාත්‍රියෙහි ඔවුන් රෝහලෙහි නිදාගත්තේ සිය අප්‍රානික බිලිඳා මැදින් තබාගෙන ය. පසු දින මල සිරුර ඔවුන් සිය නිවසට ගෙන ගියේ අනිකුත් දරුවන්ට ද එය ලඟ තබාගැනීමට හැකිවනු පිනිස ය. මෙම ක්‍රියාව එම ලිපියේ කර්තෘ බයාදු ලෙස සටහන් කලේ ඇතැමුන් ''නොසංසුන් කරවන අද්භූත භූතාවේෂයක් පවා ඇතිකරවන්නක්'' ලෙස ය. (ද බිලිවර් හෙවත් ''අදහන්නා'' 2005 මැයි 22) පැහැදිලිවම මේ පුද්ගලයාට නම් අවශ්‍යවන්නේ රාජ්‍යපාලනයේ තනතුරක් පසු පස දිව යෑම නොව, මනෝ චිකිත්සාවේ සහාය ලබාගැනීම ය.

මහා ව්‍යාපාරිකයන්ගේ අවශ්‍යතාවන් වෙනුවෙන් කැපවීම අතින් ඩිමොක්‍රැටික් පක්ෂය හා එහි නායකයන් කිසිදු අන්දමකින් රිපබ්ලිකන්වරුන්ට දෙවැනි නො වේ. ඒඑෆ්එල්-සීඅයිඕ වෘත්තීය සමිතිවල ඊනියා කම්කරු ව්‍යාපාරය ප්‍රධානතම වැරදිකරුවෙකි. පන්ති විඥානය අප්‍රානික කිරීමටත් ස්වෝත්තමවාදය ප්‍රවර්ධනය කිරීමටත් මානුෂීය හා ප්‍රගතිශීලී අදහස්වලට ඉඩකඩක් නොමැති වාතාවරනයක් නිර්මානය කිරීමටත් වෘත්තිය සමිති නිලධාරි තන්ත්‍රයන් තමන් සතු සියලු බලය යොදා කටයුතු කොට ඇත. දියුනු ධනේශ්වර ලෝකයෙහි අන් කිසිදු තැනක කම්කරු පන්තිය මහා ව්‍යාපාරවල ප්‍රහාරය හමුවේ මෙතරම් නුසූදානම් තත්වයකට පත් කොට නැත. නිල කම්කරු ව්‍යාපාරය අන් කිසිදු තැනක මෙතරම් විශාල සංස්කෘතික හා දේශපාලන මුඩු බිමක් ඉතිරි කොට ගොස් නැත.

දක්ෂිනාංශික ජනමාධ්‍ය දේශපාලන ප්‍රචන්ඩත්වයෙන් හා අසත්‍ය ප්‍රබන්ධයන්ගෙන් පිරි නරාවලකි. මර්ඩොක්ට අයත් ටැබ්ලොයිඩ් පුවත් පත් දෙකක් වන සන් හා *නිව් යෝක් පෝස්ට්* හි හුසේන් සිය යට ඇඳුමින් සිටින ඡායාරූප පලකිරීම මේ පුද්ගලයන්ගේ මානසිකත්වය සම්පින්ඩනය කොට දක්වයි. නිසැකව ම ඇමෙරිකානු හමුදා නිලධාරීන් විසින් මාධ්‍යයට කාන්දු කරන ලද මෙම ඡායාරූප පලකිරීම සිරකරුවන් අවමානයට ලක්වන පරිදි කටයුතු කිරීමට එරෙහිව පනවන ලද ජිනිවා සම්මුතීන් උල්ලංඝනය කිරීමකි. ඉතිහාසයේ දරුනත්ත ම අපරාධවලට වැරදිකරුවන් වූ නාසි නායකයින්ට පවා ඔවුන් අත් අඩංගුවට ගත් පුද්ගලයින් විසින් මූලික අයිතිවාසිකම් ප්‍රදානය කෙරුනි.

ඡායාරූපවල නීති විරෝධී හා ප්‍රකෝපකාරී ස්වභාවය සන් පුවත් පතේ තලමනාකර කර්තෘ ග්‍රේහම් ඩඩ්මන්ට මුනගැස්වූ අවස්ථාවේ දී ඔහු තරයේ ම සිය පුවත්පත ආරාක්ෂා කෙලේ ය. ''එය විශිෂ්ඨ ප්‍රතිමාමය ගනයේලා සැලකිය හැකි පුවත් ඡායාරූප පෙලකි. එම ඡායා රූප තමන් වෙත ලැබුනි නම් ඕනෑම පුවත් පතක් සඟරාවක් හෝ ටෙලිවිෂන් ආයතනයක් ඒවා පල නොකර සිටිනු ඇතැයි යන්න මම ප්‍රතික්ෂේප කරමි.'' ඔහුට බැරෑරුම් අභියෝගයක් කිසිවෙකු ගෙන් එල්ල නො වී ය.

අරාබි හා ලෝක මහජන මතයෙහි පිලිකුලක් ජනිත කල එම රූපාවලිය ඉරාකයෙහි එක්සත් ජනපද විරෝධී කැරැල්ලට බලගතු පහරක් එල්ල කරනු ඇතැයි යන අදහස ද සරල වශයෙන් අනාවරනය කරන්නේ ඇමෙරිකානු දේශපාලනමය හා මිලිටරි මානසිකත්වය තුල රජයන අතාත්විකත්වය යි.

මේ අතරවාරයේ ඔද බිඳිනලද්දා වූද වංචනික වූද ලිබරල් ජනමාධ්‍ය, දක්ෂිනාංශයෙහි ප්‍රකෝප කිරීම් ඉදිරියෙහි අබන්ධව පසුබසිති *ටයිම්ස්* පුවත්පතද රූපවාහිනී ජාලයන්හි ලිබරල්වාදී සුන්බුන් ද ඩිමොක්‍රැටික් පක්ෂ මතයෙහි විවිධ අවයව ද එවැනි පසුබෑසීමක කැටි කල ප්‍රකාශනය යයි කෙනෙකුට කිවහැක. අති දක්ෂිනාංශය අපරාජිතය යි මුලු ජනගහනයම සුන්වූ බලාපොරොත්තු සහිතව ප්‍රතිගාමීත්වයෙහි ගිලී සිටින්නේ යයි ද දැඩි ලෙස ඒත්තු ගන්වනු ලැබූ ලිබරල්වාදී පුවත්පත්, දක්ෂිනාංශික බලවේග අත්පත් කරගන්නා සෑම අඟලක්ම දකින්නේ සැතපුමක් අත්පත් කරගත්තාසේ ය. මෙම බලවේගයන් දනට ප්‍රමුඛත්වයට පත් වී ඇත්නම් ඒ අන් සියල්ලටමත් වඩා පැහැරහැරීම හේතු කොට ගෙන ය.

මහමඟ දී අහම්බෙන් ඇසෙන පුද්ගලික සාකච්ඡාවලින් පෙනීයන්නේ විශාල පිලිකුලක් ජනතාව තුල ඇති බවයි. එනමුදු, ජනතාව බොහෝකොටම එය තම තමන් අතරට සීමා කරති. ඔවුන් කවුරුන් වෙත යොමුවන්න ද? දේශපාලන සංස්ථාපනයෙහි සෑම අංශයක්ම අව්‍යාජ මහජන හැඟීම හා උත්සුකයන් නොසලකා හරී.

විසුලු සහගත ලෙස තවමත් ''සිවිල් අයිතිවාසිකම් පිලිබඳ නායකයින් ''ලෙස හඳුන්වනු ලබන කලු සහ ස්පාඤ්ඤ ජාතික දේශපාලනඥයින් 1970 පසු අවධියේ රැඩිකල්වාදී හා ලිබරල්වාදී මධ්‍යම පන්තික කොටස් ද සමඟ ව්‍යාපාර ලෝකයේ හා කොටස් වෙලඳ පොලේ පහසුවෙන් මුදල් සොයාගැනීමේ මාර්ගවලින් ධනවත් වී ඇති අතර අභ්‍යන්තරයේ නාගරිකයන් තෙවැනි ලෝකයට ආසන්න තත්වයන් දක්වා ගරා වැටී ඇත.

සංස්කෘතික කර්මාන්තය තම හෙළාදැකිය යුතු භූමිකාව ඉටු කොට ඇත. චිත්‍රපටි, ජනප්‍රිය සංගීතය, වීඩියෝ ක්‍රීඩා ප්‍රචන්ඩකරනය හා විසංවේදිකරනය ප්‍රවර්ධනය නො එසේනම්, වඩාත් නිවැරදිව, අන්තර්ගත කර ගනියි. සිද්ධීන් තුලින් ව්‍යාකුලත්වයට පත්වූ ද සමාජ හා ඓතිහාසික යථාර්ථයන් පිළිබඳ අනවබෝධයෙන්ද යුත් බොහෝ දෙනෙක් ඇමරිකාවේ විනෝද ජනක කර්මාන්තයෙහි සිත් හිරිවට්ටන නිමැවුම්වලින් අස්වැසිල්ලක් ලැබීමට තමන්ට ම ඉඩ සලසා ගනිති.

සැප්තැම්බර් 11 වැනිදායින් පසු ප්‍රමුඛ තේමාවන් හෝ මෝස්තර වශයෙන් හොලිවුඩ් චිත්‍රපටි ලෝකය වධහිංසා හා ලේවැකි පලිගැනීම් වෙත වඩ වඩාත් යොමුවෙමින් බුෂ්, චෙනි, රම්ස්ෆෙල්ඩ් හා අනිකුත් අයගේ වියරු දෙඩුම්වලට සුජාතබවක් සපයයි. චිත්‍රාගාරයක ''ක්‍රියාවන්ට'' මුල් තැනදෙන සමාන්‍ය වර්තා බිඳහෙලන චිත්‍රපටි, මල මිනී සංඛාව පිලිබඳව දක්වන්නේ පෙන්ටගනය සේ ම උදාසීනත්වයකි.

''ශිෂ්ට සම්පන්න නො වූ'' ජනතාවන් විජිතවාදී යටත් කිරීමේදී සිය මතවාදී තර්කනයෙහි කොටසක් වශයෙන් බැග්ඩාඩයෙහි බටහිර ඉවුරෙහි හෝ ඇෆ්ඝනිස්තාන කඳුකරයෙහි ''ජීවිතවලට අගයක් නොමැත්තේය'' යයි ප්‍රකාශ කිරීමට ඇමරිකානු ජනමාධ්‍ය ප්‍රිය කරයි. ඇමරිකානු ජනප්‍රිය සංස්කෘතිය තුල තරම් අන් කිසිදු තැනක ජීවිතයේ අගය එතරම් අඩුවන්නේ ද? මිනී මැරීම්, වධහිංසා හා නොයෙකුත් ආකාරයේ ජන ජීවිතය අවුල් කරන ක්‍රියා සරලවම බැරෑරුම්ව නොසැලකේ - ඒවා ''එතරම් ලොකු දේ නො වේ.'' එම ආකල්පය බලපෑමක් ඇති කොට තිබේ.

සිය අර්බුදය තුල ඇමරිකානු ධනවාදය විසින් නිපදවා ඇති සංස්කෘතිය මෙය යි. මෙය පිටුපසින් ඇත්තේ කාර්මික පිරිහීම, දැවැන්ත සමාජ ආසමානතාවය හා අන් සියල්ලන්ගේ ම ජීවන තත්වයන්ගේ වියදමෙන් සමාජයෙහි එක් ධ්‍රැවයක අසීමිත ලෙස ධනය ඒකරාශි වී තිබීමත් ය.

ඇමරිකානු ජනතාවගේ නාමයෙන් ඇෆ්ඝනිස්තානයෙහි, ඉරාකයෙහි, ගුවන්තනාමෝහි නැති ගන්වන සුලු අපරාධ සිදුකෙරේ. කම්කරු පන්තිය තෝරාගත යුත්තේ වෙනම මාර්ගයකි. වෙනම ප්‍රතිපත්තියකි. එය සමාජය සමාජවාදී ලෙස ප්‍රතිනිර්මානය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගත් සහයෝගිතාවය අවබෝධය හා දයාව මත පදනම් විය යුතු ය.

© www.wsws.org